

# ගෝඨාභයට බැණ වැදුණු පෙදරේරුවා

විත්‍රාන් මොරකන්දෙ ගමගේ

තිරිසන් සතුන් හැම විටම ජීවත් වන්නේ බියෙනි. මිනිසත්බව ලැබීමේ ප්‍රධාන ලාභය බියෙන් තොරව ජීවත් වීමට ඇති හැකියාව බව බුදුන්වහන්සේ දේශනා කළහ. එහෙත් අප රටේ සමහර වකවානුවල මිනිසාට බියෙන් තොරව ජීවත් වීමේ අවස්ථාව ලැබී නැත. මෙයට ප්‍රධාන හේතුව නම් එම වකවානුව තුළ රටේ අවනීතිය ක්‍රියාත්මක වීමය .එම වකවානුව තුළ ව්‍යවස්ථාවෙන් මිනිසාගේ ආරක්ෂාව ලබා දීමට බැඳී සිටින රජයත් නීතිය ක්‍රියාත්මක කරවන පොලීසියත් යන දෙකම තම වගකීම් පැහැර හැරියහ. ජනාධිපතිවරයා නිවේදනය කළේ තමාගේ ආරක්ෂාව තමා සලසා ගත යුතු බවය. එහෙත් රජයේ ආශීර්වාද ලැබූ මිනීමරු කල්ලි තමන්ට රිසිසේ රටතුල සැරිසරත් නම් මහජනයා කෙලෙසක තමන්ගේ ආරක්ෂාව සලසා ගන්නේද?



බ්‍රිගේඩියර් විජය විමලරත්න ගෝඨාභය කෙරේ පැහැදුනේ ඔහු කාර්යශූර නිලධාරියෙක් හෙයිනි . ඒ වනවිට ගෝඨාභය සේවය කළේ ගජබා රෙජිමේන්තුවේ පළමුවෙනි බලඇණියේ අණදෙන නිලධාරියා ලෙසය. එතෙක් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ යොදවා සිටි ගජබා රෙජිමේන්තුව 1988 මාතලේට යැවීමට සිදු වුයේ ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරකම් නිසා ඒ ප්‍රදේශයේ පැවතුන භීෂණය හේතුවෙනි .

මාතලේ ප්‍රදේශ සියල්ලක්ම පරීක්ෂා කොට බැලූ ගෝඨාභයට තේරුම් ගියේ මේ ප්‍රදේශයේ සිදුවන ඝාතනවලින් වැඩි හරියක්ම කිසිදු පදනමක් නැති ඒවා බවයි. දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයෙහි කීර්ති විජයබාහු නමින් එක් කණ්ඩායමක් මිනිසුන් ඝාතනය කළ අතර ප්‍රා, ස්රා, කහ බළල්ලු යනුවෙන් තවත් සංවිධාන මිනිසුන් ඝාතනය කළහ. මේ තත්ත්වය හරිහැටි වටහා ගත් ගෝඨාභය එය පාලනයට දිස්ත්‍රික්කයේ වැදගත් ස්ථාන කිහිපයක් තෝරා හමුදා අනුබණ්ඩ ඇති කළේය. අංක තහඩු නොමැති වාහන වලින් රාත්‍රී කාලයේ පැමිණ නිවෙස්වලින් පැහැරගන්නා තරුණයින් විවිධ වධහිංසා පමුණුවා ටයර් මත පුළුස්සා දමා ඇති අයුරු ගෝඨාභය මහත් කම්පනයට පත් කළේය. ගෝඨාභය පසුදාම ඒ ප්‍රදේශය බාර නියෝජ්‍යපොලිස්පති ප්‍රේමදාස උඩුගම්පොළ



ප්‍රේමදාස උඩුගම්පොල

සොයාගියේය. ''මීට පස්සේ නම්බර් ප්ලේට් නැති වාහනවලින් රෑට ඇවිල්ල කොල්ලො එහෙම පැහැරගන්නවා නෙමෙයි.එහෙම වුනොත් මම ඒ වාහන වලට වෙඩි තියනවා. දබරැඟිල්ල සොලවමින් ගෝඨාභය කළ තර්ජනයට උඩුගම්පොළ තිගැස්සුණේය. ගෝඨාභය දෙසබලා දත් ඇඳි දෙක එකට හාපා ගත් උඩුගම්පොළ තම කැරකෙන පුටුවේ ඉදිරියටත් පසුපසටත් පැද්දුනේය . එදින රාත්‍රියේ කළු බළලුන් විසින් පැහැර ගැනීමට නියමිත තරුණයින් පහළොස් දෙනකුගේ ලැයිස්තුවක් බුද්ධි අංශ මගින් ගෝඨාභය ගේ අතට ලැබිණ. වහා ක්‍රියාත්මක වූ ගෝඨාභයට තරුණයින්ගේ නිවෙස්වලට ඇඳිරි වැටුණු පසු ගොස් ඒ තරුණයින් පාලොස් දෙනාම අත්අඩංගුවට ගැනීමට හැකි විය. මේ දිනවල සිදුවන සිදුවීම් නිසා දෙමාපියෝ අතිශය භීතියට පත්ව සිටියහ. කිසිම කරුණක් නිසා බිය විය යුතු නැති බැව් පැවසු ගෝඨාභය පසුදා උදෑසන කඳවුරට පැමිණෙන ලෙස දෙමව්පියන්ට කීවේය. යම්කිසි කණ්ඩායමක් රාත්‍රියේ නිවසට ළමයි සොයා පැමිණිය හොත් ඔවුන් ගෙදර නැති බව පමණක් දන්වන ලෙස දෙමව්පියන්ට කී ගෝඨාභය එම නිවෙස් වලින් පිටත් විය.කිසිම දෙමවුපියෙකුට එදින රාත්‍රියේ නින්ද ගියේ නැත.

එදින රාත්‍රී 2.00 ට පමණ ළමුන් පස් දෙනෙකුගේ නිවෙස්වලට ආ තවත් කණ්ඩායමක් මෙම ළමයි ප්‍රශ්න කිරීමට පැය කිහිපයකට රැගෙන යා යුතු බැව් කීවේය. එහෙත් ළමුන් ගමනක් ගොස් ඇති බැව් කී විට දෙමව්පියන්ට අසභ්‍ය වචනයෙන් බැන වදිමින් මුලු නිවසම පරීක්ෂාකොට ඔවුහු ගියහ. සිදුවන්නේ කුමක් දැයි වැටහීමක් නැති දෙමව්පියෝ හැඬු කඳුලින් රාත්‍රිය ගතකළහ .

හමුදා කඳවුරට ගෙනා ළමයින් පාලොස් දෙනාට හමුදා භටයෝ ආහාරපාන ලබාදී රාත්‍රියේ නිදාගන්නට තැනක් සකස් කොට දුන්හ. ළමයින්ට ද එදින රාත්‍රියේ නින්ද ගියේ නැත. කිසිදු ළමයෙක් කදවුර තුළට ගෙනා බවට පිටස්තර අයට දැනගන්නට ඉඩ නොතැබිය යුතු බවට ගෝඨාභය අණ කළේය.

කිලෝමීටර 12ක් පමණ එපිට පල්ලේපොල ප්‍රදේශයේ ටයර් මත තරුණයින් තිදෙනෙක් පිළිස්සෙන බව පසුදින උදයේ දෙමාපියන්ට ආරංචි විය. සමහර දෙමවුපියන් කම්පනයට පත්වූ අතර තවත් සමහරු කෝපයට පත්විය. වහාම පල්ලේපොළ ගොස් බැලිය යුතු යැයි එක් පියෙක් කීවේය. ඊට තවත් කිහිප දෙනෙක් අනුකූලතාවය දැක්වූ අතර අනෙක් අය කිව්වේ උදෑසන නමයට කෑම්ප් එකක යා යුතු බවයි. අවසානයේ සියලුදෙනාම හමුදා කඳවුරට යාමට තීරණය කළහ. මේ කණ්ඩායමේ සිටි එක් අයෙක් පෙදරේරුවෙකි.කලින් දින රැගෙන ගිය කණ්ඩායමේ ඔහුගේ පුත්‍රයා ද විය. පියාත් සමඟ රැකියාවට යන ඔහු පියාට මහන්සි වන්නට ඉඩ නොදී හැකිතාක් වැඩ කරන්නේය. මීට කලින් අල්ලා ගෙන ගිය තරුණයෙකුට අමානුෂික වද දෙද්දී මෙම තරුණයාගේ නම කියවී ඇති බවට රාවයක් පවතී.

දෙමාපියන් සියලු දෙනා උදෑසන හමුදා කඳවුර අසලට පැමිණ ළමයින් ගැන විමසූවිට ගේට්ටුවෙ සිටි සෙබළුන් දෙදෙනා කීවේ එහෙම කිසිවෙක් මෙහි රැගෙන නොආ බවයි. දෙමව්පියො ලතෝනි දෙන්නට පටන් ගත්හ. ඔවුන්ට ගෝඨාභයගෙන් කැඳවීමක් ලැබිණ. ගෝඨාභයගේ රාජකාරි කාමරයට පැමිණි දෙමාපියෝ ඔහුට දෙස් තියන්නටත් හඬා වැලපෙන්නටත් වූහ. ඉදිරියට ආ පෙදරේරුවා ගෝඨාභයට පරුෂ වචනයෙන් බැන්නේය. විනාඩි පහක් පමණ මේ සියල්ල අසා සිටි ගෝඨාභය "හරි දැන් ඕගොල්ලෝ කියන ඒවා මම අහගෙන හිටිය. දැන් මට කතා කරන්න ඉඩාරින්න'' යයි කීවේ දැඩි ස්වරයෙනි. දෙමව්පියෝ නිශ්ශබ්ද වූහ. "මේ ගොල්ලන්ගෙ දරුවෝ ඔක්කොම මගේ ලග ඉන්නවා. ඕගොල්ලන්ට ගේට්ටුවෙ අය මෙහෙ එහෙම අය නෑ කියලා කියන්න ඇත්තේ අපි මෙහේ හැම කෙනෙකුටම ළමයි මෙහෙ ඉන්න බව රහසක් හැටියට තියාගන්න කියල කියපු නිසයි. ඕගොල්ලෝ ගිහිල්ල ළමයි බලල එන්න. විනාඩි 10 යි ගත කරන්න පුළුවන්.

සොල්දාදුවන් දෙදෙනෙක් සමග දෙමාපියෝ දරුවන් සිටින තැනට ගියහ . විනාඩි 10 කින් නැවතත් ගෝඨාභය වෙතට පැමිණියහ. ගෝඨාභය යළිත් හඬ අවදි කළේය. "අපි ශ්‍රී ලංකා යුද හමුදාවෙ, අපි ජීවත් වෙන්න වැටුප් ලබා ගන්නෙ රජයෙන්, රජයෙන් කියන්නේ රටවැසියාගේ මුදල්, ඒ කියන්නේ ඔගොල්ලන්ගේ මුදල් ,මේ වෙනුවෙන් අපිට කරන්න රාජකාරි පවරලා තියෙනවා, ඒකෙන් ප්‍රධාන දේ තමයි මහජනතාවගේ ජීවිතත් දේපලත් රැකදීම, මෙතෙන්දි අපි අපේ ජීවිතය දෙන්න වුණත් සූදානම්, අපේ කිසිම සෙබළෙක් ජීවිතයක් විනාශ කරන්නේ නෑ බැරිම අවස්ථාවක හැර, යුද්ධයකදී ජීවිත නැති වෙනව, හැබැයි නිරායුධ අයගෙ ජීවිත නැති වෙන්නේ නෑ, කලකෝලාහලයකදී ජීවිතයතක් නැති වෙන්න පුළුවන්, ඒත් ඊට පස්සේ... ඊට පස්සේ හමුදාවේ අයට ලොකු පරීක්ෂණයකට උත්තර දෙන්න වෙනව. තේරුණාද''? දෙමාපියෝ සියලු දෙනාම නිශ්ශබ්ද ය. "ඔක්කොටම තේරුණාද''?. ගෝඨාභය යළිත් ඇසීය. "එහෙමයි'' සමහරු කී අතර අනෙක් අය ඔලුව වැනූහ. "මේ රටේ මේ දවස් වල නීති විරෝධී මිනීමරු කල්ලි ඉන්නවා, ඕගොල්ලො අහල ඇති ප්‍රා, ස්රා, කහ බළල්ලු, දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය එතකොට කොළ කොටි ඔය එක එක නම් වලින්, අපට විශ්වාස කටයුතු ආරංචි මාර්ග වලින් දැනගන්නට ලැබුනා අපි අත්අඩංගුවට ගත්ත මේ ළමයි පැහැරගන්න ඒ වගේම පැහැරගෙන ගිහින් මරා දාන්න සූදානමක් තියෙනවා කියල.

පුද්ගල ජීවිත ආරක්ෂා කිරීමේ අපට ඇති වගකීම නිසා තමයි මම දරුවන් මෙහාට ගෙනල්ලා ආරක්ෂා සහිතව තියන්න හිතුවේ. ගෝඨාභය කීවේ දබරැඟිල්ල සොලවමිනි. මට හොඳටම තේරෙනව මේ කාලේ ඔයාලගේ ගෙවල්වල මේ දරුවන්ට ආරක්ෂ-ාව දෙන්න බැරි බව. ගෝඨාභය මෙසේ කියද්දී දෙමව්පියන්ගේ දෙනෙත් වලින් කඳුළු ගලන්නට විය. "ඕගොල්ලෝ ළමයි පොඩිකාලේ දූවිල්ලක්වත් වදින්න නොදී ඇග හීරෙන්නවත් ඉඩ නොදී බොහොම පරිස්සමින් බලාගන්න ඇත්තෙ . ඒ උනාට මේ නරුම කාලයේ ඕගොල්ලන්ට එයාල බලාගන්න බෑ,, ඒ වැඩේ තමයි මං මේ කරලා දෙන්නෙ'' ගෝඨාභය කිව්වේ හැඟීම්බරවය. පෙදරේරුවා එතෙක් අපහසුවෙන් මෙල්ල කරගෙන සිටි ඉකිය මහා හැඬුමක් ලෙස එළියට පැන්නේය. තව එකක් කියන්න තියෙනව. කවුරුත් දැනගන්න ඕනේ නෑ ළමයි මෙහෙ ඉන්න බව, ඕගොල්ලෝ දෙන්නෙකුට විතරක් සතියකට දවසක් මෙහෙ ඇවිල්ලා ළමයි බලල යන්න පුළුවන්, අද මං රෑ වෙලා වාහනයක් එවන්නන්. ඒකට ළමයින්ගේ ඇඳුම් පැළඳුම් ටික දාලා එවන්න. තව වැඩි කාලයක් මේ තත්වෙ තියන එකක් නෑ. හරි දැන් යන්න පුළුවන්, ''හා! හා!! හා!! මට වඳින්න එපා, ඔයාලා මට වැඩිය වැඩිමල්, මට පව් සිද්ද වෙනව, හොඳයි යන්න ආයුබෝවන් ''. දෙමාපියෝ ගෝඨාභයට සමු දුන්හ.

පසුදින පාන්දර වනතෙක්ම කිසිම දෙමව්පියෙකුට නින්ද ගියේ නැත. පෙදරේරුවා කල්පනා කළේ තමා කෑම්ප් එකේ මහත්තයාට පරුෂ වචනයෙන් බැනීම කෙතරම් නොහොබිනා ක්‍රියාවක් ද යන්නයි. මීට හරියාකාරව සමාව ගන්නා

14 වන පිටට